KIDS GOD WORSHIP
www.kidworship.kr

# ගිඩියොන්ගේ මිනිසුන් 300 දෙනා

– 18th Story–


121Page

පොතේ ගුරා — ඉශ්‍රායෙල් ජනතාව දෙවියන්වහන්සේට අකීකරුව රූප වන්දනා කරමින් සිටිය දී ඔවුන්ගේ පාපය එළිදරව් කිරීම පිණිස, දඬුවම් කිරීමට ඔවුන්ට විරුද්ධව මිදියන්වරු නැගිට වූ සේක.
මිදියන්වරු අවුරුදු 7 ක් ඉශ්‍රායෙල් කෙරේ ආධිපත්‍යය දැරුවා.
ඉශ්‍රායෙල්වරු තමුන්ගේ කෙත් වැපුරුවාට පසු මිදියන්වරු ඇවිත් ඔවුන්ගේ භෝග නාස්ති කළෝය. ඔවුන් ආහාරවත්, එළු බැටළුවන්වත්, ගවයන්වත්, කොටළුවන්වත් ඉශ්‍රායෙල්වරුන්ට ඉතුරු කළේ නැත.

කාන්තාව — (දණින් හිඳ යාච්ඤා කරමින්) එපා. එපා.
මගේ බැටලුවා. ඌව ගෙනියන්න එපා.

පිහිය අතින් ගත් මිනිසා — ඕයි.... නෑ... නෑ. මේ බැටලුවා අපේ.

විශාල මිනිසා — ඒයි... පොඩි ළමයා... ඔයාගේ අතේ තියෙන ඔක්කොම මට දෙනවා..

දුප්පත් සහෝදරයෝ — අපිට කන්න මොකුත්ම නෑ. කරුණා කරන්න. අනේ අපිට උදව් කරන්න.

පොතේ ගුරා — මේ සියලු දුක් පීඩාවෙන් ඉශ්‍රායෙල්වරු වෙතට පැමිණෙන්නේ ඔවුන්ගේම වරද නිසා බව ඔවුන් තේරුම් ගත්තා. එවිට ගැළවීම පිණිස ඔවුන් දෙවියන්වහන්සේට මොරගසන්නට පටන් ගත්තා.

...........................................................................................


122Page

පොතේ ගුරා — එක දවසක් ගිඩියොන්, මිදියන්වරුන්ගෙන් තිරිඟු සඟවගන්න පිණිස, ඒවා මුද්‍රික යන්ත්‍රයෙහි මඩිමින් සිටියා.
මේ වෙලාවේ ස්වාමින්වහන්සේගේ දූතයා ඔහු ඉදිරියේ පෙනී සිටියා.

දේවදූතයා — ධෛර්යමත්, බලවත් මනුෂ්‍යය, ස්වාමින්වහන්සේ නුඹ සමඟ සිටින සේක.
නුඹ නැගිට ඉශ්‍රායෙල්වරුන්, මිදියන්වරුන්ගෙන් මුදවා ගන්න.

පොතේ ගුරා — ගිඩියොන් දේවදූතයාට කතා කළේය.

ගිඩියොන් — අහෝ ස්වාමිනි, මම කුමකින් ඉශ්‍රායෙල් ගළවන්නද ?
මගේ පවුල මනස්සේ හි ඉතා දිළිඳු පවුලය.
මමද මගේ ගෙයි, ඉතාම කුඩා තැනැත්තාය.

පොතේ ගුරා — ඉශ්‍රායෙල්වරුන්ගේ මොරගැසීම ඇසූ දෙවියන්වහන්සේ ගිඩියොන් තෝරා ගත්සේක.
නමුත් ගිඩියොන් ඉතා භය මිනිසෙකි. ඔහු දෙවියන්වහන්සේගේ වචනය සම්පූර්ණව විශ්වාස කළේ නැත.

...........................................................................................


123Page

ගිඩියොන් — ඉශ්‍රායෙල්වරු මගේම අත් වලින් ගළවන්නේ නම් මට ළකුණක් ලබා දෙන්න.., මම බැටලු ලොම් මිටියක් පාවරේ තබන්නම්.
ලොම් මිටිය මත පමණක් පිනි ඇතුව මුලු බිම වියළී තිබුණොත්, ඔබවහන්සේ කී ලෙස මා ලවා ඉශ්‍රායෙල් ගළවන බව මම එයින් දැනගන්නෙමි.

පොතේ ගුරා — පසුදින උදෑසන ගිඩියොන් අලුයම නැගිට ලොම් මිටියෙන් පිනි මිරිකා හරින්නට පුලුවන් වුණා. නමුත් පොළොව වියළී තිබුණා.
ඔහු ඉල්ලූ ළකුණ ලැබුණා. නමුත් තවමත් ගිඩියොන්ට ස්ථිරත්වයක් නෑ.
දෙවියන්වහන්සේ, ගිඩියොන්ට නැවත කතා කළා.

ගිඩියොන් — ස්වාමිනි කරුණාකර මට තව එක් අවස්ථාවක් දෙන්න.
මේ වතාවේ මා ඉල්ලන ලකුණ නම්, මුලු බිම පිට පිනි තිබෙද්දි ලොම් මිටිය පමණක් වියළී තිබෙන්නට සලස්වනු මැනවි.

පොතේ ගුරා — දෙවියන්වහන්සේ ඒ රාත්‍රියේ එසේ කළ සේක.
ලොම් මිටිය පමණක් වියළී තිබියදී පොළොව පිට පිනි තිබෙනු ගිඩියොන් දුටුවා. අවසානයේ දී ගිඩියොන් දෙවියන්වහන්සේ මත සම්පූර්ණ විශ්වාසය තබන් පටන් ගත්තා.

..............................................................................................


124Page

පොතේ ගුරා — දෙවියන්වහන්සේ ගිඩියොනට් මෙසේ කිව්වා, “ මේ සටන් කිරීම මිදියන්ට විරුද්ධවයි. ඒ නිසා සටන් කරන්න පුලුවන් හොඳම සොල්දාදුවන් මේ වෙනුවෙන් තෝරන්න.” දෙවියන්වහන්සේ තවදුරටත් ඔහුට කතා කළා.

දෙවියන්වහන්සේ — ගිඩියොන්, මේ සොල්දාදුවන් පිරිස ඉතා වැඩියි. මා විසින් ඔවුන් අතට මිදියන්වරුන් පාවා දුන්නොත් ඉශ්රායෙල් මට විරුද්ධව අහංකාර වී අපේ අත අප ගැළවුවේයැයි කියනවා ඇත. ඒ නිසා මෙතැන සිටින අයගෙන් භය සොල්දාදුවන් සියලු දෙනාම නැවත යවන්න.

පොතේ ගුරා — එවිට සොල්දාදුවන් 20,000 ක් පිටත් කර හැරිය අතර ඉතිරිව සිටියේ 10,000 ක් පමණි.

..............................................................................................


125Page

දෙවියන්වහන්සේ — සෙනග තවම වැඩිය. ඔවුන්ව වතුර ළඟට ගෙනෙන්න. මම එහි දී ඔවුන් නුඹ උදෙසා විමසන්නෙමි.

පොතේ ගුරා — ගිඩියොන් වතුර ළඟට සෙනග ගෙනාවේය.
ස්වාමින්වහන්සේ ගිඩියොන්ට කීවේ, බල්ලා ලෙවකා බොන්නාක් මෙන් බොන අය වෙනමද, දණ ගසා බොන අය වෙනමද වෙන් කරන්න කියාය.

..............................................................................................


126Page

පොතේ ගුරා — ඒ රාත්‍රියේ දෙවියන්වහන්සේ ගිඩියොන්ට කතා කළ සේක.

දෙවියන්වහන්සේ — නැගිට මිදියන් කඳවුරට විරුද්ධව යන්න.

පොතේ ගුරා — ගිඩියොන් ඇතුලු මිනිසුන් 300 දෙනා සතුරු කඳවුර වටා සිටියෝය.
ඔවුන් සියල්ලන් අතට හොරණෑද, පන්දම්ද, හිස් කළද දී තිබුණේය.
මෙසේ මධ්‍යම රාත්‍රීයේ දී මුර මාරු කළ හැටියේම ගිඩියොන්'ද ඔහු සමග සිටි මිනිසුන් 300 දෙනාද කඳවුර අද්දරට පැමිණ හොරණෑ පිඹ තමුන්ගේ අත්වල තිබූ කළගෙඩි බින්දෝය.

සොල්දාදුවන් — අපේ කඩුව දෙවියන්වහන්සේ හා ගිඩියොන් උදෙසාය !!!

..............................................................................................


127Page

පොතේ ගුරා — මිදියන් හමුදාව එදා රාත්‍රියේ බයවී පැන දිව්වේය. ඔවුන්ගේ පිහිය, කඩුද අත්හැර දමා පලා ගියෝය.
දෙවියන්වහන්සේගේ උපකාරය ඇතුව ගිඩියොන් ඔහු සමග සිටි මිනිසුන් 300 දෙනා සමග මේ සටන ජයග්‍රහණය කළෝය.

සොල්දාදුවන් — හුරේ.... හුරේ.... අපි දිනුවා .... අපි දිනුවා ...

**ජීවිතයට අදාල කිරීම**

දෙවියන්වහන්සේ අපි උදෙසා සටන් කරන සේක.
ඒත් දෙවියන්වහන්සේ වැඩ කරනකොට මිනිසෙක් තෝරා ගන්නවා.
ගිඩියොන් බෑ කිවුවත් එයාවම තෝරාගත්තා. දෙවියන්වහන්සේ පුංචි ඔයාවත් අනාගතේ ලොකු වැඩක් කරන්න පාවිච්චි කරනවා.
ඔයා ගැන ලොකු සැලැස්මක් අපේ දෙවියන්වහන්සේට තියෙනවා.
මොකක්ද ඒ සැලැස්ම කියා දැන ගන්න පුංචි හිතට ආසාවක් එනවා නම් ඒ ගැන යාච්ඤා කරන්න.
(ඇස් වසාගෙන මෙසේ කියන්න..)
ආදර දෙවියන්වහන්ස, මම අනාගතේ වෙන්න යන්නේ කවුද?
ඔබවහන්සේ මාව තෝරාගත්තේ කුමක් කිරීමටද? ඒ දේ එසේම කරන්න.
ආමෙන්.